ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.    ඔබේ අංකය / உமது இல. / Your No.    දිනය / திகதி / Date 2022-11-04

පැමිණිලි පාර්ශවය : 1. ආර්.එම්. සුහරත්න මැණිකේ මිය,
2. ආර්.එම්. අනුර කුමාර මහතා,
26/62, කුමුදුගම,
දඩයම්තලාව.

වගඋත්තර පාර්ශවය : ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
උහන.

**පැමිණිලි අංකය : HRC/AM/73/2019**

**පැමිණිල්ලේ සැළකීරීම :-**

ඉහත පැමිණිලිකරුවන් විසින් 2019.10.09 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින්, තමන්ගේ දෙමාපියන් වන ආර්.එම්.පොඩි අප්පුහාමි හා ඒ.එම්. පොඩි මැණිකේ යන අයට 1954 වර්ෂයේ අම්/ප්‍ර/2791 හා අම්/ප්‍ර/2152 දීමනාපත්‍ර ඉඩම් ලැබුණු බව දක්වා ඇත. තම දෙමාපියන් නීතියෙන් විවාහ වී ඇති අතර, ආර්.එම්.වීරසිංහ, ආර්.එම්.සුහරත්න මැණිකේ, ආර්.එම්.අනුර කුමාර, ආර්.එම්. සිරියාවති, සහ ආර්.එම් විමලාවති යන දරුවන් පස්දෙනෙකු සිටින බවත්, මේ වන විට තම දෙමාපියන් මිය ගොස් ඇති බවත් දක්වා ඇත. තම පියා මිය යාමෙන් පසුව අදාළ ඉඩම්වල ජීවිත භුක්තිය තම නමට ලැබුණු බවත්, මව මිය යාමෙන් (2015.04.25) පසුව තම පවුලේ වැඩිමහල් පිරිමි දරුවා වන ආර්.එම්. වීරසිංහ යන අය ඉඩම් සංවර්ධන ආඥා පනතේ තුන්වන උප ලේඛනය අනුව උරුමය පවරා දෙන ලෙස ඉල්ලා ප්‍රාදේශීය ලේකම් වෙත 2015.07.06, 2015.08.31, 2015.09.11 හා 2015.11.11 දිනැතිව ඉල්ලීම් කර ඇති බවත් දන්වා ඇත.

නමුත් 2017.07.20 වනදින ආර්.එම්. වීරසිංහ සහෝදරයා මිය ගිය බවත්, ඔහුගේ බිරිඳ හා දරුවන්ද ඉඩම් සංවර්ධන ආඥා පනත ප්‍රකාරව ඉල්ලීම් කළද, ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්, උහන විසින් කිසිදු පිළිතුරක් ලබානොදුන් බවද සඳහන් කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman — 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax — 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / email — sechrcsl@gmail.com

එසේ තිබියදී, තමාගේ පියාගේ දරුවකු බව කියන අංක 04, රෝහල් පටුමඟ, ගල්තිරියාගම පදිංචි ජයසිංහ යන අයට එම ඉඩමේ උරුමය පවරා ඇති බවත්, ජයසිංහ යන අයගේ මව තම පියා සමඟ නීත්‍යානුකූලව විවාහ වී නොමැති අතර, ජයසිංහ යන අයගේ උප්පැන්න සහතිකයේ පියාගේ නම යන තැන හිස්ව ඇති බවත්, එසේ තිබියදී ඔහුට ඉඩම්වල මුල් උරුමය පවරාදීමෙන් ප්‍රාදේශීය ලේකම් අසාධරණ ලෙස ක්‍රියාකර ඇති බවත්, පැමිණිල්ලෙන් සඳහන් කර ඇත. එසේම අදාළ ඉඩම් මේ වන විටද භුක්තිය දරන්නේ තමන් හා තම දරුවන් බවටද වැඩිදුරටත් පවසා ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැළකීරීම :-**

පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, උක්ත ඉඩම් ආරවුලට අදාළ මුල් කච්චිකරු වන ආර්.එම්.පොඩිඅප්පුහාමි (මෙම අයගේ පියා) යන අයට බිරියන් දෙදෙනෙකු සිට ඇති අතර, ඔහුගේ මුල් බිරිඳ වන මියගිය ආර්.එම්. කරුණාවති යන අයට දරුවන් 06 දෙනෙකු සිටින බවත්, දෙවන බිරිඳ වන ඒ.එම්. පොඩිමැණිකේ යන අයට දරුවන් 05 දෙනකු සිටින බවත්ය. ඒ.එම්. පොඩි මැණිකේ අදාළ ඉඩම්වල ජීවිත භුක්තිකාරිය බවද, දෙමාපියන් මිය යාමෙන් පසුව පළමු බිරිඳගේ වැඩිමහල් දරුවා වන ආර්.එම්.ජයසිංහ හා දෙවන බිරිඳගේ වැඩිමහල් පිරිමි දරුවා වන ආර්.එම්. වීරසිංහ බංඩා යන අය තම උරුමය ලබාදෙන ලෙස ඉල්ලුම්කර ඇති බවත්, මෙම ආරවුල් තත්වය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවටද ඉදිරිපත් වී සමථයකට පත් කළ නොහැකි වූ බැවින්, අධිකරණමය ක්‍රියාමාර්ගයකට එළඹෙන ලෙස තමන් උපදෙස් දුන් බවත්, වගඋත්තරකරුවන් විසින් වැඩිදුරටත් දන්වා ඇත.

ඉහත ඉඩම් ආරවුල සඳහා අංක 713/ඉඩම් නඩුව 2016.03.21 දින ගරු අම්පාර දිසා අධිකරණයේ පවරා ඇති අතර, එහි පැමිණිලිකරු වන ආර්.එම්. වීරසිංහ බංඩා යන අයගේ මිය යාමත් සමඟම මෙහි ඉදිරි පැවරුම් කටයුතු ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධිවිධාන අනුව සිදුකළ යුතු බව පෙන්වාදීමෙන් ගරු දිසා මහේස්ත්‍රාත් අධිකරණය විසින් නියෝග ලබාදී ඇති බවත් දන්වා ඇත.

ඒ අනුව 26/62 දරණ ගොඩ/මඩ ඉඩම් සඳහා ලබාදී ඇති ප්‍රදාන පත්‍රවල පසු උරුමය නම්කර නොමැති බැවින් ඉඩම් සංවර්ධන ආඥා පනතේ තුන්වන උප ලේඛනය 01 වන විධිවිධාන යටතේ නියමිත තැනැත්තාට උරුමය සංවර්ධනය වන බවත්, ඒ අනුව ආර්.එම් ජයසිංහ යන අයට ඉඩම් වල මුල් අයිතිය ලබාදී ඇති බවත්, දන්වා ඇත.

එසේම, පරීක්ෂණයේදී අදාළ මුල් අයිතිය පවරා දීමේදී ආර්.එම්.ජයසිංහ මහතාගේ දියණියගේ උප්පැන්න සහතිකයේ පියාගේ නම ලෙස ආර්.එම්. පොඩි අප්පුහාමි යන්න නොදා තිබීම හා ආර්.එම්. ජයසිංහ මහතාගේ සහෝදරයන්ගේ උප්පැන්න සහතිකවල පියාගේ නම ලෙස ආර්.එම්. පොඩිඅප්පුහාමිගේ නම සඳහන්ව තිබීම හා 1954 ප්‍රදාන පත්‍ර පිරිනමන අවස්ථාවේ එහි උරුමකරු ලෙස ආර්.එම්. ජයසිංහ යන නම සඳහන්ව තිබීම යන කරුණු සැළකිල්ලට ගත් බවද කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

**පැමිණිල්ලේ විරෝධතා :-**

ශ්‍රී ලංකාවේ විවාහ නීතිය අනුව නීත්‍යානුකූලව ආර්.එම්. පොඩි අප්පුහාමි යන අය විවාහ වී ඇත්තේ, තම මව වන ආර්.එම්. පොඩිමැණිකේ සමඟ බවත්, පියාට විවාහ දෙකක් තිබී නොමැති බවත්, ආර්.එම්. ජයසිංහ යන අය විසින් ප්‍රාදේශීය ලේකම් මඟින් පියාගේ විවාහ සහතිකය හෝ තම පියා ලෙස ආර්.එම්. පොඩි අප්පුහාමිගේ නම සඳහන් උප්පැන්න සහතිකයක් ඉදිරිපත් කර නොමැතිව තිබියදී ඉඩම් සංවර්ධන ආඥා පනතේ 03 වන උපලේඛනය අනුව ඔහු වෙත තම පියාගේ ඉඩම්වල අයිතිය ලබාදීම ප්‍රාදේශීය ලේකම් සතු බලතල ඉක්මවා කටයුතු කිරීමක් බවත්, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 2007/3 අනුව ප්‍රධාන පත්‍රවල උරුමය සහතික කිරීමේදී III වනඋපලේඛනයේ මුල් සුදුස්සා හා ඉඩම් භුක්ති විඳින අයගේ එකඟතාවය මත සමථයන් ක්‍රියාත්මක කර උරුමය සහතික කිරීමට 2006/2 (1) චක්‍රලේඛයෙන් උපදෙස් දී ඇති බව දක්වා ඇති බවත්, ප්‍රාදේශීය ලේකම් එම චක්‍රලේඛ විධිවිධානද කඩකර ක්‍රියාත්මක වී ඇති බවත් කරුණු දක්වා ඇත.

**විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු :-**

1954 දී ගල්ඔය සංවර්ධන මණ්ඩලය විසින් ජනපදිකයින් පදිංචි කිරීමේදී අංක 26 ජනපදයේ අංක 62 ලිපිනය ඉඩම් සඳහා අම්/ප්‍ර/2791 හා අම්/ප්‍ර/2152 දීමනා පත්‍ර ආර්.එම්. පොඩි අප්පුහාමි නමින් නිකුත් කර ඇති බවත්, එම ආර්.එම්. පොඩිඅප්පුහාමි නැමැති මුල් කට්ටිකරු 201/12/24 වනදින මිය ගොස් ඇති බවත්, අනාවරණය වේ.

ආර්.එම් පොඩිඅප්පුහාමිට බිරියන් දෙදෙනෙකු සිට ඇති අතර, නීත්‍යානුකූලව විවාහ නොවූ පළමු බිරිඳ වන ආර්.එම්. කරුණාවති යන අයට දරුවන් 06 දෙනෙකු හා නීත්‍යානුකූල විවාහයක් ඇති දෙවන බිරිඳ වන ඒ.එම්. පොඩි මැණිකේ යන අයට දරුවන් 05 දෙනෙකු සිටින බවත්, කට්ටිකරු වූ ආර්.එම්. පොඩි අප්පුහාමි මිය යාමෙන් පසුව ප්‍රශ්නගත අම්/ප්‍ර/2791 හා අම්/ප්‍ර/2/52 දීමනා පත්‍ර ඉඩම්වල ජීවිත භුක්තිය නීත්‍යානුකූල විවාහක බිරිඳ වන ඒ.එම්. පොඩි මැණිකේ හට ලබාදී ඇති බවද අනාවරණය වේ.

ඒ.එම්. පොඩි මැණිකේ මහත්මිය මිය යාමෙන් පසුව නීත්‍යානුකූලව විවාහ නොවූ ආර්.එම්. කරුණාවති මහත්මියගේ වැඩිමහල් පිරිමි දරුවා වන ආර්.එම්. ජයසිංහ මහතා සහ නීත්‍යානුකූල විවාහක බිරිඳ වන ඒ.එම්. පොඩි මැණිකේ යන අයගේ වඩිමහල් පුත්‍රයා වන ආර්.එම්. වීරසිංහ යන දෙදෙනාම තම උරුමය ලබාදෙන ලෙස ප්‍රාදේශීය ලේකම්, උහන වෙත ඉල්ලීම් කර ඇති අතර, අදාළ ආරවුල සමථ කළ නොහැකිව ඇති බැවින් අධිකරණමය ක්‍රියාමාර්ගයකට එළඹෙන ලෙස ප්‍රාදේශීය ලේකම්, උහන උපදෙස් දී ඇති බවද අනාවරණය වේ.

ප්‍රාදේශීය ලේකම්ගේ උපදෙස් අනුව ආර්.එම්. වීරසිංහ යන අය ඉඩම් ආරවුල සඳහා අංක 743 දරණ ඉඩම් නඩුව 2016.03.21 දින අම්පාර දිසා අධිකරණයේ පවරා ඇති අතර, 2017.07.20 වන දින ආර්.එම්. වීරසිංහ යන අය මියගොස් ඇති බැවින් පැමිණිල්ල මිය යාම හේතුවෙන් අදාළ ඉඩම්වල ඉදිරි පැවරීම් කටයුතු ඉඩම් සංවර්ධන

ආඥා පනතේ ඇති විධිවිධාන අනුව සිදුකළ යුතුව ඇති බව පෙන්වා දෙමින් ගරු දිසා අධිකරණය නියෝගයක් ලබාදී ඇති බවද අනාවරණය වේ.

ආර්.එම්. වීරසිංහ මහතා මිය යාමෙන් පසුව 2017.08.27 වන දින ඔහුගේ බිරිඳ හා දරුවන් අදාළ ඉඩම්වල උරුමය පවරාදෙන ලෙස ප්‍රාදේශීය ලේකම්, උහන වෙතින් ඉල්ලීම් කර ඇති අතර, මේවන විට අදාළ ඉඩම්වල නිවාස සාදා පදිංචිව සිටින්නේ හා භුක්ති විඳින්නේ නීත්‍යානුකූල විවාහක බිරිඳ වන ඒ.එම්. පොඩි මැණිකේ යන අයගේ දරුවන් හා මුණුපුරන් බවද අනාවරණය වේ.

දීමනා පත්‍ර අම්/ප්ර/2152 ඉඩම්වල පසු උරුමය නම්කර නොමැති අතර, අංක 743 ඉඩම් නඩුවේ පැමිණිලිකරු මිය යාම හේතුවෙන් අදාළ ඉඩම්වල ඉදිරි පැවරුම් කටයුතු ඉඩම් සංවර්ධන ආඥා පනතේ විධිවිධාන අනුව කළ යුතු බවට අධිකරණය ලබාදුන් නියෝග අනුව ප්‍රාදේශීය ලේකම්, ඉඩම් සංවර්ධන ආඥා පනතේ 03 වන උප ලේඛනයේ 1 වන විධිවිධානය යටතේ නියමිත තැනැත්තාට උරුමය සරෝපනය වන බැවින් ආර්.එම්. පොඩි අප්පුහාමි මහතාගේ නීත්‍යානුකූල විවාහක බිරිඳ නොවන ආර්.එම්. කරුණාවති යන අයගේ වැඩිමහල් දරුවා වන ආර්.එම්. ජයසිංහ යන අය ඉහත ඉඩම්වල මුල් අයිතියට නම්කර ඇති බව අනාවරණය වේ.

උප්පැන්න සහතිකයේ පියාගේ නම සඳහන් නොවන හා නීත්‍යානුකූල විවාහයක් නොමැති ආර්.එම්. කරුණාවති මහත්මියගේ පුතු වන ආර්.එම්. ජයසිංහ මහතාට ඉඩම් වල මුල් උරුමය ලබාදීම පිළිබඳව පැමිණිලි පාර්ශවය විරෝධතා දක්වා ඇතත්, ඒ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්, උහන අවධානය යොමුකර නොමැති බව අනාවරණය වේ.

අදාළ මුල් අයිතිය ලබාදීමේදී 1954 දිගල්ඔය සංවර්ධන මණ්ඩලය විසින් ජනපදිකයන් පදිංචි කිරීමේදී ලබාදුන් සහතිකයේ පසු උරුමකරු ලෙස 1987 දීමනාපත්‍ර වල පසු උරුමය නම් කර තිබීම හා ඔහුගේ සහෝදරයන්ගේ හා දියණියගේ උප්පැන්න සහතිකවල පියාගේ හා සීයාගේ නම් ලෙස ආර්.එම් පොඩි අප්පුහාමි යන්න සඳහන්වීම මත ඉඩම් සංවර්ධන ආඥා පනතේ 03 වන උපලේඛනය අනුව ආර්.එම්. ජයසිංහ මහතා උරුමකරු වශයෙන් ප්‍රාදේශීය ලේකම්, උහන තීරණය කර ඇති බව අනාවරණය වේ.

අංක වැපළ/ඉ/6/26/62 හා 2015.11.11 දිනැති ලිපිය මඟින් ප්‍රාදේශීය ලේකම්, උහන ආර්.එම්. ජයසිංහ මහතාට අදාළ ඉඩම් පැවරීම සඳහා ආර්.එම්. ජයසිංහ මහතාගේ උප්පැන්න සහතිකය මව හෝ පියාගේ විවාහ සහතිකයේ මුල් පිටපත ලබාදෙන ලෙස දන්වා ඇති අතර, වෙනත් කිසිදු ලියවිල්ලක් මේ සඳහා වලංගු නොවන බවත්, එකී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ආර්.එම්. වීරසිංහ නමින් උරුම පවරන බව දන්වා ඇති බවත්, අනාවරණය වේ.

ඉඩම් කොමසාරිස් ජනරාල් ඉදිරිපත් කළ අංක 5/2/6 රන්බිම චක්‍රලේඛ හා 2007.09.19 දිනැති චක්‍රලේඛ අංක 2007/3 අනුව ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කර ඇති දීමනා පත්‍රයක් පසු අයිතිකරු නම් නොකර

මිය ගිය අවස්ථාවක කලත්‍රයා නොමැති විටක III වන උප ලේඛනයේ මුල් සුදුස්සාට උරුමය සරෝපනය වන බව දන්වා ඇත. එසේම III වන උප ලේඛනයේ මුල් සුදුස්සා හා ඉඩම භුක්ති විඳින අනෙකුත් අයගේ එකඟතාවය මත සමථයන් ක්‍රියාත්මක කිරිම සඳහා උරුමයන් සහතික කිරිමට ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2006 2(1) චක්‍රලේඛයෙන් උපදෙස් දී ඇති බව සඳහන් කර ඇති බවද අනාවරණය වේ.

උක්ත ගැටළුසහගත තත්වය මත ඉඩම් උරුමය කවරෙකුට ලබාදිය යුතුයැයි ප්‍රාදේශීය ලේකම් උහන ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් උපදෙස් ඉල්ලා ඇතත්, ඒ පිළිබඳව උපදෙස් ලැබීමට පෙර මෙම පැවරීම කර ඇති බවද අනාවරණය වේ.

**නිගමනය :-**

ඉඩම් සංවර්ධන ආඥා පනතේ III වන උප ලේඛනයේ I වන විධිවිධාන යටතේ පසු උරුමකරු නම් නොකර මියගිය අවස්ථාවක කලත්‍රයාද නොමැති විට පවුලේ වැඩිමහල් පිරිමි දරුවාට ඉඩමේ අයිතිය සාරෝපනය වේ. ඒ අනුව පැමිණිල්ලට අදාළ ඉඩම් වල මුල් අයිතිය සාරෝපනය විය යුත්තේ ආර්.එම්. පොඩි අප්පුහාමි මහතාගේ නිත්‍යානුකූල විවාහක බිරිඳ වන ඒ.එම්. පොඩි මැණිකේ මහත්මියගේ වැඩිමහල් පිරිමි දරුවා වන ආර්.එම්. වීරසිංහ බණ්ඩා මහතාට බව නිරීක්ෂණය වේ. ඔහුද මිය ගොස් ඇති බැවින් ඔහුගේ බිරිඳ හා දරුවන්ට අයිතිය සාරෝපනය විය යුතු වන නමුත්, ඒ පිළිබඳව අවධානය යොමුනොකර ප්‍රාදේශීය ලේකම්, උහන විසින් ආර්.එම්. පොඩි අප්පුහාමි මහතා හා නිත්‍යනුකූල විවාහයක් නොමැති ආර්.එම්. කරුණාවති මහත්මියගේ වැඩිමහල් පිරිමි දරුවා වන ආර්.එම්. ජයසිංහ යන අයට අදාළ ඉඩම්වල මුල් උරුමය පැවරීම නීත්‍යානුකූල නොවන බව නිරීක්ෂණය වේ. එසේ සිදුකිරිම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 03 වන පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව මඟින් පැමිණිලි පාර්ශවයට හිමිව ඇති මූලික අයිතිවාසිකම් වගඋත්තර පාර්ශවය වන උහන ප්‍රාදේශීය ලේකම් විසින් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව, වගඋත්තරකරු විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බැවින්, ඉඩම් සංවර්ධන ආඥා පනතේ III වන උපලේඛනය අනුව අදාළ ඉඩම් සඳහා නිත්‍යානුකූල උරුමකරුවන් වන, ආර්.එම්. වීරසිංහ බණ්ඩා මහතාගේ බිරිඳ හා දරුවන් වෙත අදාළ උරුමය ලබාදීම සඳහා කටයුතු කර, ප්‍රාදේශීය ලේකම් විසින් ආර්.එම්. ජයසිංහ මහතාට ලබාදී ඇති උරුමය අවලංගු කිරිමට කටයුතු කළ යුතු බවට වගඋත්තර පාර්ශවය වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022. 12 . 20 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විජිත නානායක්කාර,
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. Vijitha Nanayakkara
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. අමාත්‍යතුමා,
'මිහිකත මැදුර',
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

02. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය
අම්පාර.

B/